# විමුක්ති අරගල පිළිබඳ නූතන සමාජ කතිකාවත

අජිත් තල්වත්ත

## හැඳින්වීම

1453 කොන්ස්තන්තිනෝපාලය තුර්කීන් විසින් යටත් කැගැනීමත් සමඟ පෙර අපරදිග සබඳතා බිඳ වැටුනේ ය. පෘතුගාලයෙන් ආරම්භවූ දේශ ගවේශණ ව්‍යාපාරය තුළින් ආගම ව්‍යාප්තියත් වෙළඳ කටයුතු ද ප්‍රචලිතවීම සිදුවි ය. මෙම ක්‍රියාවලිය නිසා යටත්විජිත බිහිවීම ද සිදුව ඇත. පෘතුගාලයට සමගාමීව සෙසු රාජ්‍යයන් ද යටත්විජිත පිහිටුවාගැනීමේ තරඟයේ නිරත විය. ඒ අතරින් යටත්විජිත පිහිටුවීමේ ප්‍රමුඛයා වූයේ මහා බ්‍රිතාන්‍යයයි. හිරු නොබසින අධිරාජ්‍ය ලෙස හඳුන්වන්නේ ද ඔවුන් තුළ පැවති සුවිශේෂී හැකි යාව නිසා ය. බටහිර ජාතීන් ස්වකීය විජිතවල පාලනය ගෙනගියේ දැඩි මර්දනකාරී පසුබිමක් තුළ ය. මෙනිසා සමාජ අසහනකාරීත්වය දිනෙන් දින වර්ධනයවී ඇත. ඔවුන් බටහිර මතමාද ප්‍රචලිත කිරීම හරහා ස්වදේශිකත්වය මුලුමනින් ම නොසලකා හරින ලදී. මෙනිසා බටහිර යටත්විජිතවාදයට එරෙහිව ජනතා නැගීසිටීම් බොහෝමයක් ඉතිහාසය පුරා දක්නට ලැබේ. යටත්විජිතවාදය නිසා ලොව බොහෝ රාජ්‍යය පීඩනයට භාජන විය. ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍යයට නතුවූ රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව වැදගත් වේ. ඉන්දීයානු සාගරයේ උපායමාර්ගික අවශ්‍යතාය මත මෙරට බලය පිහිටුවා ගැනීමට ඔවුන් කටයුතු කරන කළේ ය. 1796 දී මෙරට බලය ගොඩනගාගත් ඉංග්‍රීසීන් වසර 19ක් ඇවෑමෙන් රාෂ්ට්‍රමය පාලකයන් ලෙස කටයුතු කිරීමට අවකාශය උදාකර ගත්තේ ය. එතැන් පටන් දක්නට ඇත්තේ කඩුව සහ තුවක්කුව අධාරයෙන් පවත්වාගෙන ගිය යටත්විජිත පාලනයකි. මෙවන් පරිසරයක් තුළ ජනතා නැගීසිටීම් පැවතීම නියත සාධකයෙකි. මෙරට වැසියන් ද බ්‍රිතාන්‍යගේ අසාධාරණ යටත්විජිත පාලනයට එරෙහිව පෙළගැසුනු අවස්ථා ගණනාවක් ඇත. ඉන් වඩාත් වැදගත් වන්නේ 1818 පළමු විමුක්ති සටන ය. ලොව බොහෝ රාජ්‍යන්හි ජාතික ව්‍යාපාරයේ මුල් අවස්ථාවේ දක්නට ඇත්තේ අරගලන් ය.

## විමර්ශනය

නූතන ඉතිහාසකරණ සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ලිබරල් ඉතිහාසකරණය සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීම යි. මෙමගින් සිදුවන්නේ යටත්විජිතවාදය මගින් ලෝකය පුරා බටහිර ධනවාදයත්, බටහිර දේශපාලනය ව්‍යුහය මත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයත් ව්‍යාප්ත වීම යි. මෙම තත්ත්වය 19 වන සියවසේ මුල් කාලයේ සිට ම දක්නට ලැබුණි. බටහිර ධනේශ්වර පන්තියේ ආකල්ප සඳහා ප්‍රමුඛ බවක් මෙම ඉතිහාසකරණ සම්ප්‍රදාය මගින් ලබා දී ඇත. 19 වන සියවසේ මුල් කාලය වනවිට බටහිර ධනේශ්වර පන්තිය සමාජයේ ප්‍රබල පිරිසක් බවට පත්විය. යටත්විජිත සමාජවල පූර්ණ අධිකාරිත්වය දරමින් කටයුතු කිරීමට ද මෙම පිරිසට හැකි විය.[1] නොදියුණු මිනිසා ශිෂ්ටත්වයට ගෙන ඒමේ දී යටත්විජිත සමාජය සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ බවට මතයක් ගොඩනැගී තිබුණි.

1 Mendis,G.C.**Ceylon Under British**, Second Revised Editor, Colombo,1948, P.47.

එම අදහස අනුව යටත්විජිතවාදය සාධාරණීයකරණය සඳහා වැඩි උත්සාහයක් ගන්නා ලදී. මෙම සම්ප්‍රදාය මෑතක් වනතුරු ම යටත්විජිත සමාජවල ඉතිහාසය ලිවීමේ දී මූලික ලෙස අනුගමනය කරනු ලැබේ. එනමුත් එය මූලික වශයෙන් ප්‍රශ්න කිරීමට භාජනය වනනේ පශ්චාත් නූතනවාදී චින්තනය වර්ධනය වීම මගිනි. මෙම අදහස ව්‍යාප්ත වන්නේ පශ්චාත් යටත්විජිතවාදි චින්තනයේ ආරම්භවීමත් සමග ය. [2] මෙම මතය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී Ranagith Guha ගේ "Dominance Without Hegemony; History and Power in the Colonial India[3]" නම් කෘතිය ඉතා වැදගත් වේ. එහි අන්තර්ගත කරුණු මේ සඳහා යොදාගත හැකි ය.

බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය ආරම්භ වන්නේ කඩුවේ ආධාරයෙන් බව පශ්චාත් නූතනවාදින් පෙන්වා දුන්නත් ලිබරල් ඉතිහාසකරණය තුළ එවැනි මතවාද දක්නට ලැබේ. ආසියානු යටත්විජිතවල ආධිපත්‍ය පිහිටුවීමේ දී කල්පනා කිරීමකින් තොරව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ගොඩනැගූ බවට තර්කයක් ඉදිරිපත් කර යටත්විජිතවාදය සාධාරණීයකරණය සිදු කර තිබේ. රනජිත් ගුහා ඉදිරිපත් කරන ව්‍යුහය තුළ ඉතිහාසකරණය සහ යටත්විජිතවාදය අතර කිට්ටු සබඳතාවක් පවතී. එබැවින් ඉහතින් පෙන්වා දුන් ආකාරයට ඉතිහාසකරණයේ දක්නට ඇත්තේ ධනේශ්වර පන්තියේ ආකල්ප මුදුන්පත්කර ගැනීමකි. සෑම සංවාදයක ම බල ව්‍යුහයක් ඇති අතර, එය මෙහෙයවනු ලබන්නේ සිය වරප්‍රසාද ආරක්ෂා කර ගැනීමට හැකි වන අයුරෙනි.[4]

යටත්විජිතවාදයේ පීඩනය නිසා ජනතාව ප්‍රතික්‍රියා දැක්වීම වැදගත් ක්‍රියාදාමයකි. මෙයිනුත් ඉතා වැදගත් වන්නේ යටත්විජිත විරෝධී අරගල ය. යටත්විජිත ඉතිහාසකරණයේ විශේෂ ලක්ෂණය වන්නේ ගැමි අරගල එතරම් වැදගත් නොවන බව සාමාන්‍යයෙන් පිළිගැනීමයි. අරගල යටත්විජිතවාදය තුළ ඇති වූ සුළු සුළු කරදර මිස යටත්විජිතවාදයට තර්ජනයක් නොවූ බව පෙන්වයි. මෙම පසුබිම තේරුම් ගත් රනජිත් ගුහා විසින් (Subaltern School) සාමාන්‍ය ජනතාව ගෙනගිය අරගලවල වැදගත්කම හුවා දැක්වීමට උත්සාහ ගනු ලැබීය. නූතන යුගය වන විට එය යටත්විජිතවාදයේ වැදගත් තේමාවක් බවට පත් වී තිබේ. යටත්විජිත ඉතිහාසකරණයේ ගැමි කැරලිවලට පහත් තැනක් ලබාදීමට ප්‍රධාන හේතු දෙකකි.

i. යටත්විජිත පාලකයින් ඒ අරගලවලට වැදගත් තැනක් නොදීම මගින් ඒවා මර්දනය කිරීමට දැඩි ක්‍රියාමාර්ග ගැනීම සාධාරණීයකරණය කිරීම.

ii. දේශීය ප්‍රභූ පන්තිය යටත්විජිත විරෝධී ව්‍යාපාරයේ ප්‍රභූ නායකත්වය හා ප්‍රභූ ආධිපත්‍ය හුවා දැක්වීමට ගැමි අරගලවලට නිසි තැනක් නොදීම.

19 වන සියවසේ දී ලංකාවේ ඇතිවූ අරගල සම්ප්‍රදාය බලන විට ඉතිහාසකරණයෙන් ඉතා වැදගත් තැනක් හිමිකර දී නොමැත. විශේෂයෙන් 1818 කැරැල්ල පිළිබඳ මද අවධානයක් යොමු කර ඇත. බ්‍රිතාන්‍යයන් 1818 කැරැල්ල කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොකළේ නම් ඔවුන්ට උඩරටින් යාමට පාවා සිදු වන්නේ ය.[5]

බටහිර ඉතිහාසකරණය දෙස අවධානය යොමු කරන විට හේක්ස් බෝන් සහ ජෝර්ජ් රූඩි විසින් යටත්විජිතවල ඇතිවූ අරගල ප්‍රාථමික කැරලි ලෙස හඳුන්වති. රොබින්හුඩ්,

2 තල්වත්ත,අජිත්,උඩරට රාජධානිය සහ 1818 කැරැල්ල,ආරිය ප්‍රකාශකයෝ,වරකාපොළ,2009, 32 පිට.

3 Guha, Ranagith, **Dominance Without Hegemony; History and Power in the Colonial India,** Harvard University Press, Cambridge, 1997, PP.12-15.

4 මෙන්ඩිස් ජී.සී. ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, ඇපොතිකරීස් සමාගම, කොළඹ, 1963, 67 පිට.

5 විමලරත්න කේ.ඩී.ජී.ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ,1992,69 පිට.

සරදියෙල් වැනි අය ප්‍රාථමික කැරලිකරුවෝ ය. 1820 ගණන් වන විට එංගලන්තයේ ශීඝ්‍ර කාර්මිකරණයත් සමඟ කෘෂිකාර්මික සමාජයේ මෙතෙක් පැවති සාමකාමීභාවය බිඳ වැටී නව යන්ත්‍ර සූත්‍ර ආදේශයත් සමඟ සමාජයේ පැවැත්ම සංකීර්ණ විය. මෙම තත්ත්වයට එරෙහිව කැප්ටන් ස්වුවට්ගේ නායකත්වය යටතේ කැරලි ඇති වී කර්මාන්ත ශාලාවල තිරිඟු අඹරණ යන්ත්‍ර විනාශ කළත් තිරිඟුවලට හානි නොකරයි. තිරිඟු ඔවුන් හට යැපීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන ධාන්‍යයකි. ධාන්‍ය විනාශ කළහොත් පාඩුව අත්වීමට සිදුවන්නේ ජනතාවට ම ය. එනමුත් බටහිර ඉතිහාසකරණය මඟින් මෙම කැරලි දකින්නේ සැහැල්ලුවෙන් සහ ප්‍රාථමික ආකාරයෙනි.

බටහිර ලිබරල් චින්තනය මඟින් ඉදිරිපත් වන තවත් අදහසක් වන්නේ සෑම පුරවැසියෙකු ම රාජ්‍යයක සාමාජිකයෙකු බවයි. ඒ අනුව ඔහුට අයිතිවාසිකම් හා යුතුකම් ඇත. රාජ්‍ය වෙනුවෙන් බදු ගෙවීම් ආදී දෑ වගකීම් ලෙස පෙන්වා දිය හැකි ය. ඔහුට ඇති අයිතිවාසිකම් හඳුනා ගැනීමේ දී දේශපාලන බලය ඒකාධිපති ක්‍රමයට පවතී නම් ඊට විරුද්ධව කටයුතු කිරීමට ජනතාවට අයිතියක් ඇත. එංගලන්තයේ උත්කෘෂ්ට විප්ලවය මඟින් ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් රජවරුන්ගේ හිතුවක්කාර පාලනයට එරෙහිව ක්‍රියා කිරීමට හැකි ඉඩ ප්‍රස්තාව උදා විය. ලංකාවේ බ්‍රිතාන්‍යයන්ගේ පාලනය විඳ දරා ගැනීමට නොහැකි වන විට එයට එරෙහිව ක්‍රියාත්මකවීමට පුරවැසියන්ට අයිතියක් නැති අතර, යුතුකම් පමණක් යටත්විජිත රජය වෙනුවෙන් ඉටු කළ යුතු ය.

මෙම තත්ත්වය තුළ කෙසේ ද අරගල ඇති විය හැක්කේ. යම් යම් උද්ඝෝෂණ කළත් දේශපාලන අරගල කිරීමට ඔවුනට හැකි යාවක් නොවී ය. රජතුමා ධාර්මිකව කටයුතු නොකරන විට ඔහුව බලයෙන් නෙරපීමට අතීතයේ සිට ම ජනතාවට අයිතියක් ඇත. එම පසුබිම තුළ ජනතාව අපේක්ෂා කරන්නේ ධාර්මික පාලනයකි.[6] එය අභිබවා ගියවිට මිනිස්සු කැරලි ගැසීමට පෙළඹෙති. එම නිසා මෙම කැරලි දේශපාලන කැරලි නොවේ යැයි දැක්වීමට නොහැකි ය.[7] එම කැරලි ඇතිවන්නේ යම්කිසි පදනමක් තුළ සිට වුවත්, යටත්විජිතවාදය තුරන් කිරීමට හැකි යාවක් නොමැත. කැරලිකරුවෝ යම් ක්‍රියාමාර්ගවලට පෙලඹුණත් සෑම දෙයක් ම විනාශ නොකරති. තර්කානුකූලව සිතා බලා කටයුතු කළ නිසා ඒ තුළ දේශපාලන දැක්මක් නොවූ බව පිළිගත නොහැකි ය. විශේෂයෙන් ම පෘතුගීසි අවධියේ දී පන්සල්, දේපළ අයිති කර ගෙන පල්ලියට හා රදලයන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගතිති. එනමුත් පීඩනය වැඩිවත්ම ජනතාව පල්ලියට පහර නොදෙන අතර, පූජකයාගේ ගෙදර විනාශ කරති. මෙයින් පැහැදිලි වන්නේ ඉතිහාසකරණය මඟින් මෙහි දේශපාලන දැක්මක් නැති බවට ප්‍රකාශ කළත්, කැරලිකරුවන්ගේ ක්‍රියාකාරකම් මඟින් එහි පැහැදිලි දේශපාලන ආකල්ප දකින්නට ලැබුණ බවයි. ලිබරල් ඉතිහාසකරණය පිළිබඳ අදහස් දැක්වූ හොක්ස් බෝන්, රූඩී වැනි අය ප්‍රකාශ කරන්නේ කැරලිවලට සම්බන්ධ වූ අයගේ පැහැදිලි දේශපාලන දැක්මක් නොවූ බවයි. එහෙත් එම මතවාදයන් පිළිගැනීමට තරමක් දුරට අපහසු ය.

ඉතිහාසකරණයේ කැරලි සම්ප්‍රදාය තුළ පැහැදිලි නායකත්වයක් නොවූ බව පෙන්වා දේ. එනමුත් මේ කැරලි විග්‍රහ කිරීමේ දී පෙන්වා දෙන දෙයක් වන්නේ ඒ ඒ අවස්ථාවේ කැරැල්ලේ ස්වභාවය අනුව නායකත්වය බිහි වන බවයි. පුද්ගල තාරාතිරම මත නොව ඔවුන්ගේ කැපවීම තුළ නායකත්වය ඇති වේ. ඒ නිසා කලින් හඳුනා ගත් නායකයින්ට වඩා ක්ෂණිකව පත්වූ නායකයින් මේ කැරලිවල දක්නට ලැබේ. ලංකාවේ කැරලිවල මෙන් ම ප්‍රංශ විප්ලවය අවධියේ මිනිසුන් ඉදිරියට තල්ලු වී නිර්භීතව හා කැපවීම මත

6 අභයසිංහ, පී,ඇම්.පී. උඩරට විත්ති, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1957, 56 පිට.

7 එම.

නායකත්වය බිහි වේ. මෙම කැරලිවල දේශපාලන දැක්මක් පැවති බව මනාව පැහැදිලි වන්නේ කැරැල්ල අතරතුර නාමමාත්‍රිකව රජ කෙනෙකු හඳුනා ගැනීම මගිනි. නමුත් එමගින් රාජාණ්ඩු ක්‍රමයකට නොයන නිසා කැරලිකරුවන් දේශපාලන අරමුණු නොමැති අය ලෙස හැඳින්විය නොහැකි ය. 1818 කැරැල්ලේ දී දොරේ සාමි රජු ලෙස අභිෂේක ලැබීම නිදසුන් ලෙස පෙන්වාදිය හැකි ය.[8] ඔහුට සාපේක්ෂව කැප්පෙටිපොළගේ භූමිකාව ද ඉතා වැදගත් වේ. මෙම ලක්ෂණය යටත්විජිත සමාජයන්හි දක්නට ලැබේ. නොයෙක් කැරලිවල සාම්ප්‍රදායික නායකත්වයක් සිතීමක් නොමැත. ඒ වෙනුවට නොයෙක් අරමුණු පෙරටු කොට ගෙන පැවති සමාජ, ආර්ථික, රටාව නැවත ස්ථාපිත කිරීමට උත්සහ ගනී. එය කැරැල්ල විසින් විනාශ කිරීමට උත්සහා කරන යටත්විජිත ආධිපත්‍ය තරම් පීඩාකාරී නැති බව අවබෝධ වේ.[9] එවැනි අවබෝධයක් පැවති බවට සාක්ෂ්‍ය පවතින බැවින්, කැරලිකරුවන්ට දේශපාලන විඥානයක් නැතැයි පිළිගත නොහැකි ය.

කැරලි ගැන ඉතිහාසකරණය මගින් පවත්වනු ලබන තවත් මතවාදයක් වන්නේ එහි කිසිදු සැලසුම්කරණයක් නොමැතිව ක්ෂණිකව වර්ධනය වූවක් ලෙස ය. මෙහි ද එතරම් සත්‍යයක් නැත. කැරලිකරුවෝ නොයෙක් ආකාරවලින් තමන්ගේ පීඩනයට හේතුවන පුද්ගලයා හෝ ආයතන වෙනස් කිරීමට, ඒ සඳහා වගකිවයුතු පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීමට උත්සහ ගනිති. ඒවා නොයෙක් ආකාරයේ දුක්ගැනවිලි පෙත්සම්, උද්ඝෝෂණ මඟින් ඉදිරිපත් කෙරේ. එමගින් තමන් අපේක්ෂා කරන සාධාරණත්වය නොලැබෙන විට ජනතාව කැරලි ගැසීමට පෙලඹෙති. නමුත් අරගලයට යොමුවීමට පෙර තමන්ගේ සමාජයේ සාම්ප්‍රදායික නායකයන්ගෙන් සාම්ප්‍රදායික ආයතන (ගම් සභා, වරිග සභා, ග්‍රාමීය පන්චායත්) සමඟ සාකච්ඡා කරයි. පාලන ව්‍යුහය භාවිත කර තමන්ගේ දුක්ගැනවිලිවලට සාධාරණත්වයක් අපේක්ෂා කරයි. මෙසේ විකල්ප ක්‍රමයක් මෙන් ම, ආර්ථික කටයුතු ගැන කථා කිරීමත් කැරලිවලට පෙර දක්නට ඇත.[10] මෙහි අපට පැහැදිලි වම දැකිය හැකි වන්නේ යටත්විජිත විරෝධී වැඩපිළිවෙළක් නොමැතිකමයි. අරගලයට දායකවූවන් යටත්විජිත ආධිපත්‍ය දුර්වල කිරීමට අවශ්‍ය සැලසුම් සහ ජය ගත් පසු ගනු ලබන ක්‍රියා මාර්ග ගැන සැලසුම් කරයි. එබැවින් මෙම අරගල දේශපාලන වශයෙන් වැදගත්කමක් නැති සිදුවීම් ලෙස සැලකීම යුක්ති සහගත නැත.[11]

මේ ආකාරයෙන් බලන විට 1818 විමුක්ති සටන ප්‍රභූන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා රදල ප්‍රධානීන් ඇති කළ එකක් පමණක් නොව සාමාන්‍ය ජනතාවගේ ඍජු දායකත්වය ද දක්නට ලැබුණි. එනිසා මෙය ද කැරැල්ලක් ලෙස හඳුනාගත හැකි ය. මෙම ගැමියන්ට තිබුණු ප්‍රශ්න මොනවාද, තමන්ට තිබුණු වරප්‍රසාද, බුද්ධාගමට තිබූ තැන ආදීය පිරිහී යයි. 1818 අරගලය අවසන් වී වසරක් යාමට පෙර නව බදු ක්‍රම ඇති කරයි. බදු අය කිරීම අකුරට ම සිදු කර ඇත. නියම ගැටලුව ඇති වන්නේ එවිට ය. සාම්ප්‍රදායික සමාජයක පැවති බදු ක්‍රමය යටත්විජිතවාදය තුළින් නීති පද්ධතියක් මගින් කාර්යක්ෂම කරයි. නීතිය ඉදිරියේ කිසිවෙකුට අනුකම්පා කිරීමක් නොමැත. එනිසා ගැමියා හා නීතිය අතර සම්බන්ධතාවක් නොවී ය. ග්‍රාමීය සමාජයේ පැවති නිලධාරී සබඳතා වෙනුවට නීති පද්ධතියක් පැමිණීම නිසා පාලකයන් හා පාලිතයන් අතර, අන්‍යෝන්‍ය සම්බන්ධතාව බිඳ වැටී පීඩනය වර්ධනය විය. 1817-1818 උඩරට ඇතිවූ අරගලය උඩරට නායකත්වයේ

8 අබයසිංහ, ටිකිරි, දේවරාජ, ශ්‍රීමති සහ සෝමරත්න, ජී.පී.වී. උඩරට රාජධානිය, ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ, 1977, 88-94 පිටු.

9 පෙරේරා, එස්.ජී. ලංකා ඉතිහාසය, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ, 1945, 90 පිට.

10 Scotte,James, **The Moral Economy of the Peasant Rebellion and Subsistence in South East Asia,** Yale University Press, London, 1976, P.108.

11 Kannangara P.D. **The History of Ceylon Sivil Service**, Dehiwala, 1960,P.02.

වුවමනාවට ඇතිවූවක් නොව එවැන්නක් ඇති වීමට තරම් සාමන්‍ය ජනතාවගේ දුක්ගැනවිලි රාශියක් තිබුණි.

## සමාලෝචනය

බටහිර ධනේශ්වර මතවාද මත පදනම්වූ ඉතිහාසකරණ සම්ප්‍රදාය මගින් සිදු කළේ පක්ෂග්‍රාහී ඉතිහාසකරණයකි. එනිසා සාධාරණ ඉතිහාසකරණයක් බිහිවූවායැයි සිතීම බුද්ධිගෝචර නැත. 1818 අරගලය පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රභූ ඉතිහාසකරණය මගින් එතරම් විශේෂ අවධානය යොමු කර නොමැති බව ගම්‍ය වන කරුණකි. එනිසා මෙම අරගලයේ සැබෑ ස්වරූපය නිවරදි ලෙස ඉදිරියට ආවේ නැත. මෙම අරගලයේ සැබෑ ස්වරූපය අනාගත පරපුරේ දරුවන්ට නිවැරදි ලෙස උරුමවී නොමැති බවක් පෙනේ. නිදහස් අරගලයට වසර 200 පිරෙන මොහොතේ දී මෙහි ඇති වැදගත්කම අනාගත පරපුරට අවබෝධ කරදීම ජාතියේ පරම වගකීම වේ.

10 DEC 2019
මිහින්තලේ
125520